# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2257/54 - 2021 දෙසැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2021.12. 09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: DSO/HOM/LAC/124.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/5/2019/CEB/110.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 590 ඒ මාගම්මන බටහිර ග්‍රාම නිලධාරි වසමේ මාගම්මන ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 520004-04-67 සහ 2021.03.31 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 585 සහ 586 වශයෙන් දරන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0064 ක් වූ පහත මායිම් තුළ පිහිටි ඉඩම් කැබලි :

01. **කැබලි අංක 585**
ඉඩමේ නම: අඹගහලන්ද; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අරලිය ලෑන්ඩ් හෝම්ස් (පුද්) සමාගම; ප්‍රමාණය: හෙක්: 0.0354.

02. **කැබලි අංක 586**
ඉඩමේ නම: අඹගහලන්ද; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කටුවාන කුලසිරිකුමාරගේ මාවත, 4 වන පටුමග, අංක 323/4/සී ලිපිනයේ පදිංචි සුමිත් කොතලාවල; ප්‍රමාණය: හෙක්: 0.0310.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජනවාරි මස 28 වැනි දින පෙ.ව. 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 ජනවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**බී. ඒ. ඩී. චින්තක,**
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2021 දෙසැම්බර් මස 06 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0095